# සිංහල -8 ශ්‍රේණිය

## නාම පද

නාම පද යනු මොනවාද?

යම්කිසි දෙයක්,යම්කිසි කෙනෙක්,යම්කිසි ස්ථානයක් හැඳින්වීමට යොදන පද නාම පද වේ.

නාම පද ප්‍රධාන කොටස් 2 කට බෙදේ.

1. ප්‍රාණවාචී නාම පද (පණ ඇති)
2. අප්‍රාණවාචී නාම පද(පණ නැති)

- **ප්‍රාණවාචී නාම පද**

ජීවයක් ඇති පණ ඇති දෙයක් පිළිබඳව හඟවන පද ප්‍රාණවාචී නාම පද ලෙස හඳුන්වයි. සචේතනික නාම පද ලෙස ද හඳුන්වයි.

උදා:මිනිසා,ගැහැණිය,රජතුමා, රැජින,කුරුල්ලා

- **අප්‍රාණවාචී නාම පද**

ජීවයක් පණ නැති දෙයක් පිළිබඳව හඟවන පද අප්‍රාණවාචී නාම පද ලෙස හඳුන්වයි. අචේතනික නාම පද ලෙස ද හඳුන්වයි. සියලුම අප්‍රාණවාචී නාම පද නපුංසක ලිංගයට අයත් වේ.

උදා:මල,මේසය,පාසල,පොත,ගහ

## නාමයේ ප්‍රභේද

නාම පද ප්‍රධාන කොටස් 4 කට බෙදා දැක්විය හැකිය.

1. නාම නාම
2. සර්ව නාම
3. සමාස නාම
4. ප්‍රත්‍යාර්ථ නාම

- **නාම නාම**

නාම නාම පහත ආකාරයට කොටස් 5කට බෙදේ.

**1. ජාති නාම**

කිසියම් වර්ගයක් හෝ ජාතියක් හඟවන නාම ජාති නාම ලෙස හඳුන්වයි.

උදා:මිනිස්, හරක්, කුරුලු, බලු

**2. ද්‍රව්‍ය නාම**

යම් ද්‍රව්‍යයක්,දෙයක් හඳුන්වන නාම ද්‍රව්‍ය නාම ලෙස හඳුන්වයි.

උදා:ගස්, පොත්, මල්, ලී

**3. ගුණ නාම**

යම් දෙයක හෝ යම් කෙනෙකුගේ ඇති ලක්ෂණයක් හඳුන්වන නාම ගුණ නාම ලෙස හඳුන්වයි.

උදා:හොඳ ,නිල්, සුදු, මිහිරි

4. **ක්‍රියා නාම**

ධාතුවකින් පසුව ප්‍රත්‍යය එක් වීමෙන් සෑදෙන නාම ක්‍රියා නාම වේ.

උදා:නැටීම්, බැලීම්, වැයීම්, දිවීම්

5. **සංඥා නාම**

යම් කෙනෙක්, යම් දෙයක්, යම් තැනක් විශේෂයෙන් හඳුනා ගැනීම උදෙසා යොදන නාම සංඥා නාම ලෙස හඳුන්වයි.

උදා:කමල්, මානෙල්, සීගිරිය, කලා වැව, කොළඹ,ගම්පහ

- **සර්ව නාම**

සියලු දෙනාටම පොදුවේ භාවිත කළ හැකි නාම සර්ව නාම වේ.

උදා:මම, අපි, නුඹ, නුඹලා, තෝ, තොපි, ඔබ, ඔබලා, ඇ, ඔහු, මිනිස්සු

- **සමාස නාම**

විවිධ අර්ථ කීපයක් එක් වී සෑදෙන ඒකාර්ථවත් පද සමාස නාම ලෙස හඳුන්වයි.

උදා:සියපත, දිනකර, කිරිබත්, ගස්වැල්

- **ප්‍රත්‍යාර්ථ නාම**

ප්‍රත්‍යාර්ථ නාම කොටස් 2 කට බෙදා දැක්විය හැකිය.

1.**තද්ධිත නාම**

නාමයකට පසුව ප්‍රත්‍යයක් යොදා සාදා ගනු ලබන නාම තද්ධිත නාම වේ.

උදා:ගැමි, තොටි, සාමාජික, බුද්ධිමත්

2.**කෘදන්ත නාම**

ක්‍රියා ප්‍රකෘතියෙන් සෑදෙන නාම කෘදන්ත නාම වේ.

උදා:ලියනු, සිහමන්, නැටුම්, බලනු

**ඉහත සටහන් ලියා ගැනීමෙන් පසු පහත අභ්‍යාස කරන්න.**

**අභ්‍යාස**

**1.**පහත සඳහන් පද සුදුසු නාම පදවලට බෙදා දක්වන්න.

ලංකා, විශාල, රෝස, රාණි, බුරුසුව, සුවඳ, වැටුණු, දුෂ්ට, ගැයුම්, පනින්නා, නයා, ගඩොල්, රතු, ගිරවා, ලී, රමණීය, මොනරා, කෝමල, නීලා, ඇඳ, සිනිඳු

**2.**ඔබේ සිංහල පෙළ පොතේ 88 පිටුවෙහි ඇති ලිඛිත අභ්‍යාස කරන්න.

**3.**සිංහල පෙළ පොතේ 9 වන පාඩම කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ජී.ලලනි වත්සලා

ර/ සුමන ම.ම.වි